

# මගේ ලස්සන පූස්



ඩබ්ලිව්. මනුදි රිත්මලී වීරපටබැඳි

# මගේ ලස්සන පූස්

ඩබ්ලිව්. මනුදි රිත්මලී වීරපටබැඳි

# මගේ ලස්සන පූස්


කතෘ : ඩබ්ලිව්. මනුදි රිත්මලී වීරපටබැඳි

පාසල : මහ/මහමායා බාලිකා විදුහල - 3 ශ්‍රේණිය E


කතෘගේ වෙනත් කෘති :
- ඇස් ලොකු බණ්ඩා
- කොළපාට එළිය
- අශ්ව පැටියාගේ අළුත් යාළුවා
- කැලෑ ගමේ සෙල්ලම් ඉස්කෝලේ
- සමනල පැංචිගේ මල් නැතිවෙලා


ප්‍රථම මුද්‍රණය : 2025.02.08

ISBN අංකය : 978-624-208-647-7

# පිදුම

සැමදා අපගේ

නැණ ගුණ පුබුදන

මහමායා මව්තුමියට

ආදරයෙන් පුදමි....

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# මගේ ලස්සන පූස්

මගෙ පූස් පැටියා ඉන්නේ මගේ ගෙදර නෙමෙයි. එයා ඉන්නේ ගමේ. අපේ ගෙදර එයාව ගේන්න බැහැ. මොකද අපේ ගෙදර ඉස්සරහම මහ පාර. අපේ ගමේ නම් තියෙන්නේ බොරළු පාරක්. එහෙ එච්චර වාහනත් නැහැ. අත්තලගේ ගෙදර ඉන්න කළු පූසි පැටවු දෙන්නෙක් දැම්මා. එක පැටියෙක්ට වෙච්චි දෙයක් නැහැ. අනික් පැටියා නම් පොඩි සද්දෙටත් බය වෙවී අපිත් එක්ක සෙල්ලම් කරනවා. හැබැයි එයා හරිම දඟයි. මැස්සොත් අල්ලන්න හදනවා.

පූස් පැටියා අද දෙමලිච්චෙක්ව අල්ලන්න පොල් ගහක නැගලා ලිස්සලා බිම වැටුනා. එයා කොහොමත් හැම තිස්සෙම ලිස්සනවා. මම තාම එයාට නමක් දැම්මේ නෑ. මොකද මම එයා ගැහැණු ද පිරිමිද කියල දන්නේ නැති නිසා. ඔක්කොටම වඩා සෙල්ලම් කරන්නේ අම්මා.



පැටියා ඊයේ රෑ දොර රෙද්දත් එක්ක සෙල්ලම් කරා. අක්කාගේ ගවුමේ පටි දෙකත් හැපුවා. පොල් අත්තක් දැම්මොත් ඒකත් එක්ක සෙල්ලම් කරනවා. එයා පොල්, පපඩම් කන්න හරිම ආසයි. එයාගේ වැඩේම සෙල්ලම් කරන එක. දවසක් එයා මාවත් බය කරලා එයත් බය වුණා. එයා සාලේ ලොකු පුටුවම නිදාගන්න අයිති කරගෙන. එයා හැන්ගෙනවා හැන්ගෙනවා ඉවරයක් නැහැ.

දවසක් පූස් පැටියා බල්ලෙක්ට බය වෙලා දුවගෙන ඇවිත් වැටුණා. එයා අපිත් එක්ක ටීවී බැළුවා. පූස් අම්මට තියෙන්නේ ලස්සන කොළ පාට ඇස්. පැටියත් හරිම ලස්සනයි. පැටියා අද බත්කූරෙක් අල්ලන්න හැදුවා. බත්කූරා පියාඹලා ගියා පැටිය බැලුවා බත්කූරා කොහෙද අතුරුදහන් වුණේ කියලා.



අද උදේ එයා එයාගේ හෙවනැල්ලත් එක්ක සෙල්ලම් කළා. එයාම  එයාගේ අතට ගහ ගත්තා. ලීලාවතී නැන්දා පැටියාට පොල් දදයි හිටියේ. පැටියා දාපු පොල් ටික කන්න නැමෙනකොට එයාගේ ඔළුවටත් පොල් වැටුනා. එයා ඒක දන්නේ නැහැ.



ඊයේ රෑ පැටියා මෙරුවෝ ඇල්ලුවා. එයා අපිට නිදාගන්න දුන්නේ නෑ. ඇඳට පනිනවා. අම්මා ආපහු එයාගේ පුටුවෙන් තියනවා. එයා ටිකකින් ආයෙත් ඇඳට එනවා. හරිම කරදරයක් වුණා ඒක.



නිවාඩුව ඉවර වෙලා අපි ගෙදර ආවා. පැටියා ගැන හැමදාම මම අත්තගෙන් අහනවා. අත්තා දවස් දෙකකට අපේ ගෙදර ආවා. අත්තා ජනේල වහලා ඇවිත් තිබුණේ. ඒ නිසා පැටියාට ගේ ඇතුළට යන්න බැරි වෙලා. අත්ත ආපහු ගෙදර යනකොට පැටිය ඉඳල නෑ. අපි හැමදාම කෝල් කරල අහනවා පැටියා ආවද කියලා. ඒත් එයා ඇවිත් නෑ. අත්තා කිව්වා බල්ලෙක් අරන් යන්න ඇති කියලා. ඒකට මට ගොඩක් දුකයි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN : 978-624-208-647-7